# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2269/76 - 2022 මාර්තු මස 04 වැනි සිකුරාදා - 2022.03.04

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

**1974 අංක 2 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 2 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ, 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ජල සම්පාදන අමාත්‍ය, වාසුදේව නානායක්කාර වන මම, එකී මණ්ඩලයට, දන්කොටුව (අදියර I) ජල සම්පාදන ව්‍යාපෘතියේ, මැටිකොටුව ඝන මීටර් 60,000ක ජල තුළුමුව ඉදිකිරීම සඳහා ඉඩම් කොටසක් අවශ්‍යව ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටසේ නිශ්චල දේපළ අයිතිය අත්කර ගැනීම මෙම නියමයෙන් අනුමත කරමි.

වාසුදේව නානායක්කාර,
ජල සම්පාදන අමාත්‍ය.

යොමු අංකය : DVP/02/04/PX/432.
2022 පෙබරවාරි මස 25 වැනි දින,
ජල සම්පාදන අමාත්‍යාංශය,
"ලක්දිය මැදුර", අංක 35,
නව පාර්ලිමේන්තු පාර,
පැලවත්ත, බත්තරමුල්ල.

උපලේඛනය

වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, දංකොටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 472, මැටිකොටුව ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, මැටිකොටුව ගමේ පිහිටි "සියඹලාගහවත්ත" නමැති ඉඩමෙන් පහත සඳහන් මායිම් තුළ පිහිටි පර්චස් 92ක් පමණ වන ඉඩම් කොටස :

මායිම් :

*උතුරට* : මෙම ඉඩමේ ඉතිරි කොටස ;
*නැගෙනහිරට* : මෙම ඉඩමේ ඉතිරි කොටස ;
*දකුණට* : මාඔය ;
*බටහිරට* : මා ඔය දක්වා යෝජිත නව පිවිසුම් මාර්ගය.

1A - G 36275 — 32 (2022/03)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

ඉඩමට හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය : 1. ටී. පී. ආර්. ප්‍රනාන්දුපුල්ලේ මහතා,
අංක 412, ආර්. ඒ. ද මැල් මාවත,
කොළඹ 03.

EOG 03 - 0764

---

**1974 අංක 2 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 2 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ, 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ජල සම්පාදන අමාත්‍ය, වාසුදේව නානායක්කාර වන මම, එකී මණ්ඩලයට, ගඟ ඉහළ කෝරළේ ජල සම්පාදන ව්‍යාපෘතියේ, පිටකන්ද සේවා ජලාශයට ප්‍රවේශ මාර්ගය ඉදිකිරීම සඳහා ඉඩම් කොටස් අවශ්‍යව ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටස්වල නිශ්චල දේපළ අයිතිය අත්කර ගැනීම මෙම නියමයෙන් අනුමත කරමි.

**වාසුදේව නානායක්කාර,**
ජල සම්පාදන අමාත්‍ය.

යොමු අංකය : DVP/02/01/KY/440.
2022 පෙබරවාරි මස 25 වැනි දින,
ජල සම්පාදන අමාත්‍යාංශය,
"ලක්දිය මැදුර", අංක 35,
නව පාර්ලිමේන්තු පාර,
පැලවත්ත, බත්තරමුල්ල.

**උපලේඛනය**

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, ගඟඉහළ කෝරළේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 1054, පිටකන්ද ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, හල්දොල, උඩහේනතැන්න ගමේ පිහිටි, "සමර්සෙට් වත්ත" නමැති ඉඩමෙන් පහත සඳහන් මායිම් තුළ පිහිටි පර්චස් 08ක් පමණ වන ඉඩම් කොටස් දෙක :

කැබලි අංක : 01
ඉඩමේ නම : සමර්සෙට් වත්ත
ප්‍රමාණය : පර්චස් 02

මායිම් :
*උතුරට* : එස්. ජී. වීරක්කොඩි හිමිකම් කියන ඉඩම ;
*නැගෙනහිරට* : එස්. ජී. වීරක්කොඩි හිමිකම් කියන ඉඩම ;
*දකුණට* : මෙම ඉඩමේ ඉතිරි කොටස ;
*බටහිරට* : මෙම ඉඩමේ ඉතිරි කොටස.

කැබලි අංක : 02
ඉඩමේ නම : සමර්සෙට් වත්ත
ප්‍රමාණය : පර්චස් 06

මායිම් :

| | | |
|---|---|---|
| *උතුරට* | : | අඩි පාර සහ මෙම ඉඩමේ ඉතිරි කොටස ; |
| *නැගෙනහිරට* | : | මෙම ඉඩමේ ඉතිරි කොටස ; |
| *දකුණට* | : | නිවාස වලට යන පාර ; |
| *බටහිරට* | : | අඩි පාර. |

ඉඩමට හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය : කැබලි අංක : 01

ආර්. ඒ. නිහාල් රත්නායක මහතා,
හල්දොල,
උඩහේන්තැන්න.

කැබලි අංක : 02

සභාපති,
ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව,
අංක 475, කඩුවෙල පාර,
ගනේහේන,
බත්තරමුල්ල ;

සහ

ඩබ්ලිව්. ජී. ධර්මසේන මහතා,
සමර්සෙට් ජනපදය,
උඩහේන්තැන්න.

EOG 03 - 0765

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.